ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය

කැලණිය විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව 2014

கம்பஹா விக்ரமாரச்சி ஆயுர்வேத கல்வி நிறுவகம்

களனிப் பல்கலைக்கழகம்

2014 ஆம் ஆண்டுக்கான ஆண்டறிக்கை

**Gampaha Wickramarachchi Ayurveda Institute**

**University of Kelaniya**

**Yakkala**

**Annual Report – 2014**

# වාර්ෂික වාර්තාව
# 2014

## ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
## කැලණිය විශ්ව විද්‍යාලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995 මාර්තු මස 13 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 862/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ (2) හා 24 (ආ) යටතේ 1995 අංක 01 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලිය ප්‍රකාශයට පත් කර තිබේ. එමගින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස පිහිටුවා ඇත.

එකී නියමාවලියේ ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී යන අධ්‍යයන වර්ෂ පහකින් සමන්විත උපාධි පාඨමාලාවක් පවත්වාගෙන යාම ප්‍රධාන පරමාර්ථය වී ඇත.

ඒ අනුව 1995 මාර්තු 01 දින සිට උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් පවත්වාගෙන යන මෙම ආයතනයේ 2014 වර්ෂය සඳහා වූ ආයතනික කටයුතු හා සංවර්ධනය ඇතුළත් වාර්ෂික වාර්තාව අවසාන ගිණුම් වාර්තාව හා 2014 වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් වූ රජයේ විගණකාධිපති විසින් ලබා දී ඇති වාර්තාව මෙයින් ඉදිරිපත් කරමි.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ
නිසි බලධාරී

# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය
# අධ්‍යක්ෂකගේ වාර්තාව

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට සකස් කරන ලද 2013 – 2017 දක්වා වන සංයුක්ත සැලැස්ම මෙම ආයතනයේ 2013.07.19 දින පැවැති 206 වන කළමනාකරණ මණ්ඩලයේ දී අනුමත කර තිබේ.

ඒ අනුව උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළයුතු මට්ටමකට ළඟා කර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

සංයුක්ත සැළැස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැලැක්විය හැකි හේතුන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟා කර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතුය.

සංයුක්ත සැලැස්ම සංශෝධනය කර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසය යි.

මහාචාර්ය ජයන්ත වැලිහිඳ
නිසි බලධාරී.

# පටුන


| | කාරණය | පිටු අංක |
|---|---|---|
| 01 | ආයතනයේ දැක්ම | 01 |
| 02 | මෙහෙවර ප්‍රකාශය | 02 |
| 03 | අධ්‍යක්ෂ තුමියගේ පණිවුඩය | 03 |
| 04 | සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 04 |
| 05 | දේශීය සිසුන් පිළිබඳ විස්තර | 04 |
| 06 | විදේශීය සිසුන් පිළිබඳ විස්තර | 04 |
| 07 | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 05-08 |
| 08 | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර | 08 |
| 09 | පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 09 |
| 10 | වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 09 |
| 11 | සම්මාන ලැබීම් පිළිබඳ විස්තර | 10 |
| 12 | ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර | 10 |
| 13 | පුනරාවර්ථන වියදම් විස්තර | 11 |
| 14 | ප්‍රාග්ධන වියදම් විස්තර | 11 |
| 15 | ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය විදේශීය මූල්‍ය දායකත්වය) | 11-12 |
| 16 | ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය විදේශීය මූල්‍ය දායකත්වය) | 12 |
| 17 | මූල්‍ය තත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) | 13 |
| 18 | මූල්‍ය තත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර ( අභ්‍යාන්තර ආදායම්) | 13 |
| 19 | මූල්‍ය ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය | 13 |
| 20 | යටිතල පහසුකම් | 14 |

| | | |
|---|---|---|
| 21 | වෙනත් විස්තර | |
| 21.1 | පුස්තකාලය | 14 |
| 21.2 | පරිගණක අංශය | 14 |
| 21.3 | යටිතල පහසුකම් | 14 |
| 22 | අධ්‍යක්ෂ වාර්තාව | 15 - 16 |
| 23 | 2014.12.31 දිනට මූල්‍ය තත්වය දැක්වෙන ප්‍රකාශය | 17 |
| 24 | 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය | 18 |
| 25 | විගණකාධිපති වාර්තාව | 19 – 26 |
| 26 | විගණකාධිපති වාර්තාවට පිළිතුරු | 27 – 33 |

වාර්ෂික වාර්තාව

1. ආයතනයේ දැක්ම

## දැක්ම

කුසලතා පූර්ණ උපාධිධාරීන් බිහි කිරීම මගින් ආයුර්වේද අධ්‍යයන පිළිබඳ විශිෂ්ය මධ්‍යස්ථානය බවට පත්වීම

2

2. මෙහෙවර ප්‍රකාශය -

## මෙහෙවර

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මෙහෙවර වනුයේ, ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ විද්‍යාත්මක දැනුම හා අවබෝධය වර්ධනය කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා පහත දැක්වෙන අරමුණු හා ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමය.

"මෙම ආයතනයේ අධ්‍යාපනය ලබන සිසුන් හැම අතින්ම සංවර්ධනය කිරීම සඳහා සුදුසු වාතාවරණයක් බිහි කිරීම, ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රායෝගික සහ පර්යේෂණ දියුණු කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අවශ්‍යතාවන්ට සරිලන නවීන ඉගැන්වීම් සහ පුහුණුවීම් තුළින් දැනුම ළඟා කර ගැනීම පිණිස ප්‍රායෝගික පුහුණුවීම් වලට පදනම් වන පරිසරයක් ගොඩනැඟීම, පවත්නා ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේ දී උපාධි පාඨමාලාවේ ව්‍යුහාත්මක වෙනසක් ඇති කරමින් ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා සැළසුම් සකස් කිරීම, ශ්‍රී ලංකාවේ සහ දේශයෙන් පිටත සෞඛ්‍ය ක්ෂේත්‍ර සම්බන්ධ කටයුතුවල නියැලී සිටින ආයතන සමග අන්තර් සම්බන්ධතාවන් ගොඩනැංවීම ,අවශ්‍ය සුදුසුකම් හා උනන්දුවක් සහිත මානව සම්පත් කණ්ඩායමක් ආයතනය තුළ බිහි කිරීම "

3. අධ්‍යක්ෂ තුමියගේ පණිවුඩය -

අ. හැඳින්වීම

ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟාකර ගැනීමට සකස් කරන ලද 2013–2017 දක්වා වන සංයුක්ත සැලස්ම මෙම ආයතනය 2013.07.19 දින පැවැති 206 වන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

ආ. ජයග්‍රහණය

උපාධි අපේක්ෂක සිසුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය අගය කළ යුතු මට්ටමකට ළඟාකර ගැනීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමු.

ඇ. අඩුපාඩු

සංයුක්ත සැලස්මේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී නොවැළැක්විය හැකි හේතූන් හා අනපේක්ෂිත බාධාවන් නිසා ඇතැම් ඉලක්ක ළඟාකර ගැනීමට අපොහොසත් වූ බව කිව යුතු ය.

ඈ. අනාගත සැලසුම්

සංයුක්ත සැලැස්ම සංශෝධන කරනු ලැබූ අතර එමගින් සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක යම් ප්‍රමාණයකින් ඉදිරි වර්ෂයේ දී ළඟා කර ගත හැකි වේ යයි මාගේ විශ්වාසයයි.

විෂය නිර්දේශ සංශෝධනය කිරීමේ කටයුතු පළමු සහ දෙවන කාර්තු වල දී ක්‍රියාවට නැංවූ අතර 2010/2011 අධ්‍යයන වසරේ ප්‍රථම වසර සිසුන් සඳහා නව විෂය නිර්දේශය අනුව දේශන ආරම්භ කිරීමට හැකිවිය.

විද්‍යායතනයට ප්‍රධාන අඩුපාඩුවක්ව පවතින විදුලි ජනක යන්ත්‍රය 2014 වසරේ දී ස්ථාපනය කරන ලදී.

ආයතනය සඳහා පවතින භූමි ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බැවින් ආයතනය වටා ඇති මුඩුබිම් අත්පත්කර කර ගැනීම සඳහා කරනු ලැබූ ඉල්ලීමට අදාළ වැඩ කටයුතු කාර්ය ඉටුකර ගන්නා තෙක් ඉදිරියට ගෙන යාමට අපේක්ෂා කරමි.

4. සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර -

| ආයතනය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2014.12.31 දිනට | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (බී.ඒ.එම්.එස්.) | 411 | 39 | |
| මුළු ගණන | | 411 | 39 | |

5. දේශීය සිසුන් පිළිබඳ විස්තර -

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම | පළමු වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | 5 වන වසර සිසුන් | උපාධිය ලබාගත් සිසුන් |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය (2010 වර්ෂයේ සිට මාධ්‍යය - ඉංග්‍රීසි ) | B.A.M..S. | ඉංග්‍රීසි | 120 | 72 | 85 | 81 | - | - | 49 |
| | | සිංහල | - | - | - | - | 90 | 83 | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| මුළු ගණන | | | 120 | 72 | 85 | 81 | 90 | 83 | 49 |

6. විදේශීය සිසුන් පිළිබඳ විස්තර - නැත.

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම | පළමු වසර සිසුන් | 2 වන වසර සිසුන් | 3 වන වසර සිසුන් | 4 වන වසර සිසුන් | උපාධිය ලබාගත් සිසුන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| මුළු ගණන | | | | | | | | |

7. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර -2014

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය/ ආධුනික | තාවකාලික කථිකාචාර්ය | ප්‍රදර්ශක වරුන් |
|---|---|---|---|---|---|---|---|---|
| මූලධර්ම අධ්‍යයන අංශය | ජ්‍යොතිෂ මූලධර්ම | ඉංග්‍රීසි | | | 05 | 03 | 06 | 03 |
| | භූත විද්‍යාව | | | | | | | |
| | BPHM 11011 History of Medicine | | | | | | | |
| | HBHA 11014 Manavasariraraca navijnana (Human Gross Anatomy )- Ayurveda part Moder n Part | | | | | | | |
| | HBHP 11024 Manavasariraraca navijnana (Human Physiology) - Ayurveda part Moder n Part | | | | | | | |
| | HBBC 11032 Introduction to Biochemistry | | | | | | | |
| | BPEN 11023 English for Ayurveda Medical Education | | | | | | | |
| | BPIT 11031 Information & Communication Technology 1,11 | | | | | | | |
| | BPEN 11041 Advanced English for Scientific Communication 1,11 | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | BPPV 12052 Padarthavijnana | ඉංග්‍රීසි | | | | | | | |
| | HBHH 12044 Human History | | | | | | | | |
| | HBHP 12054 Manavasariraracan avijnana (Human Physiology )11 - Ayurveda Part Moder n Part | | | | | | | | |
| | HBMN 12063 Metabolism and Nutrition | | | | | | | | |
| | BPSA 12062 Sanskrit for Ayurveda 1 | | | | | | | | |
| | BPTL 12072 Tamil Language for Ayurveda practice | | | | | | | | |
| | BPHL 13082 Hindi Language for Ayurveda practice | | | | | | | | |
| | HBEG 21072 Embryology and Genetics | | | | | | | | |
| | HBHP 21084 Manavasarirakriya vijnana (Human Physiology)111 – Ayurveda Part Moder n Part | | | | | | | | |
| | HBMB 21093 Molecular Biology | | | | | | | | |
| | HBIM 21102 Immunology | | | | | | | | |
| | BPSA 21094 Sanskrit for Ayurveda 11 | | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | BPSA 21101 Sanskrit for Advanced Studies in Ayurveda 11 | ඉංග්‍රීසි | | | | | | |
| | BPSA 22111 Sanskrit for Advanced Studies in Ayurveda 11 | | | | | | | |
| ද්‍රව්‍යගුණ විඥාන | ද්‍රව්‍යගුණ විඥාන | ඉංග්‍රීසි | | 01 | 07 | 02 | | 01 |
| | රස ශාස්ත්‍රය | | | | | | | |
| | භෛෂජ්‍ය කල්පනා | | | | | | | |
| | ඖෂධ පැල වගාව | | | | | | | |
| | විශ්ලේෂක රසායන විද්‍යාව | | | | | | | |
| | ශාඛ රසායනය හා ස්වාභාවික නිෂ්පාදන | | | | | | | |
| චිකිත්සා අධ්‍යයන අංශය | කාය චිකිත්සා | ඉංග්‍රීසි | | | 08 | 03 | | 01 |
| | කාය චිකිත්සා | | | | | | | |
| | කාය චිකිත්සා දේශීය චිකිත්සා | | | | | | | |
| | කාය චිකිත්සා | | | | | | | |
| | කාය චිකිත්සා | | | | | | | |
| | කාය චිකිත්සා | | | | | | | |
| | කාය චිකිත්සා | | | | | | | |
| | කාය චිකිත්සා/ රෝග විඥාන | | | | | | | |
| | අගද තන්ත්‍ර | | | | | | | |
| | ස්වස්ථ /Health & Epidemiology | | | | | | | |
| | ස්වස්ථ | | | | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශය | ශල්‍ය | ඉංග්‍රීසි | | | 02 | 01 | | 01 |
| | ශාලක්‍ය | | | | | | 01 | |
| කෞමාරභෘත්‍ය හා ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය | ස්ත්‍රීරෝග | ඉංග්‍රීසි | | | 02 | 03 | | |
| | බාලරෝග | | | | | | | |
| | ප්‍රසූතතන්ත්‍ර | | | | | | | |
| මුළු ගණන | | | | 01 | 24 | 12 | 06 | 06 |

8. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර -

| ආයතන අංශය / අංශය | විධායක කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික | මාණ්ඩලික | කණිෂ්ඨ | සුළු සේවක |
|---|---|---|---|---|---|
| පාලන අංශය | 02 | 4 | 9 | 7 | 2 |
| විභාග අංශය | 01 | 3 | 4 | 1 | 1 |
| ගිණුම් අංශය | 02 | 3 | 8 | - | 2 |
| වෛද්‍ය විද්‍යා තාක්ෂණ අංශය | | 1 | 1 | 1 | - |
| ද්‍රව්‍යගුණ විඥාන | | - | 3 | 1 | 2 |
| මූලධර්ම | | 2 | 1 | 1 | 3 |
| පරිගණක අංශය | | - | 1 | - | 1 |
| පුස්තකාලය | | 1 | 2 | 3 | 1 |
| ශල්‍ය ශාලක්‍ය | | 1 | 1 | - | 1 |
| චිකිත්සා | | 1 | 3 | 1 | 1 |
| ස්ත්‍රීරෝග | | - | 2 | - | 1 |
| පශ්චාත් උපාධි | | - | 1 | - | 1 |
| නඩත්තු අංශය | | 1 | 2 | 4 | 7 |
| මුළු ගණන | 05 | 17 | 38 | 19 | 23 |

9. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර -

| විෂයය | ප්‍රකාශිත | මුදල් ඉපයීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ ගණන | | | |
| මූලධර්ම අධ්‍යයන අංශය | 15 | - | 08 |
| චිකිත්සා අධ්‍යාන අංශය | 15 | - | 09 |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 13 | - | 21 |
| ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශය | 04 | - | - |
| ස්ත්‍රී රෝග හා කෞමාරභෘත්‍ය අධ්‍යයන අංශය | 17 | - | - |
| ආ. නව සොයා ගැනීම් | | | |
| ඇ. සඟරා ගණන | | | |
| ඈ. පොත් ගණන | | | |
| ඉ. ලිපි ගණන | | | |
| චිකිත්සා අධ්‍යාන අංශය | 02 | - | 01 |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 04 | - | 03 |
| ස්ත්‍රී රෝග හා කෞමාරභෘත්‍ය අධ්‍යයන අංශය | 03 | - | - |
| ඊ. වෙනත් | | | |
| මුළු ගණන | 76 | | 42 |

10 වැඩ සටහන් ,සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර -

| විෂයය | සහභාගී වූ | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| අ. පශ්චාද් උපාධි වැඩසටහන් | | | |
| චිකිත්සා අධ්‍යාන අංශය | 04 | 03 | 03 |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | - | 01 | 01 |
| ස්ත්‍රී රෝග හා කෞමාරභෘත්‍ය අධ්‍යයන අංශය | 03 | - | - |
| ආ. පශ්චාද් ඩිප්ලෝමා වැඩසටහන් | | | |
| චිකිත්සා අධ්‍යාන අංශය | 02 | - | - |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | - | 01 | - |
| ඇ. උපාධි වැඩසටහන් | | | |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 01 | - | - |
| ඈ. ඩිප්ලෝමා වැඩ සටහන් | | | |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 04 | 01 | - |
| ඉ. සහතික පත්‍ර පාඨමාලා වැඩසටහන් | | | |
| ඊ. වෙනත් | | | |
| මූලධර්ම අධ්‍යයන අංශය | 06 | - | - |
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය (වැඩමුළු /සම්මන්ත්‍රණ) | 15 | 04 | 02 |
| ස්ත්‍රී රෝග හා කෞමාරභෘත්‍ය අධ්‍යයන අංශය | 06 | - | 04 |
| මුළු ගණන | 41 | 10 | 10 |

11. සම්මාන ලැබීම් පිළිබඳ විස්තර

| විෂයය | සම්මාන ගණන | අධ්‍යයන කාර්ය මණ්ඩලය | සිසුන් ගණන |
|---|---|---|---|
| අ. දේශීය සම්මාන<br>චිකිත්සා අධ්‍යාන අංශය<br>ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය<br>ස්ත්‍රී රෝග හා කෞමාරභෘත්‍ය අධ්‍යයන අංශය | 03<br>04<br>02 | 03<br>04<br>02 | -<br>-<br>- |
| ආ. ජාතික සම්මාන<br>මූලධර්ම අධ්‍යයන අංශය<br>චිකිත්සා අධ්‍යාන අංශය | 01<br>01 | 01<br>01 | -<br>- |
| ඇ. ජාත්‍යන්තර සම්මාන | | | |
| ඈ. වෙනත්<br>ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | 01 | 01 | - |
| මුළු ගණන | 12 | 12 | - |

12. ආරම්භ කරන ලද නව පාඨමාලාවල විස්තර -

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | සහතික පත්‍ර | ඩිප්ලෝමා | පශ්චාද් ඩිප්ලෝමා | පශ්චාද් උපාධි | දර්ශන පති | දර්ශන ශූරී |
|---|---|---|---|---|---|---|---|---|
| ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය | ආයුර්වේද ෆාමසි ඩිප්ලෝමා පාඨමාලාව 11-2014 | සිංහල | - | 01 | - | - | - | - |
| ශල්‍ය ශාලක්‍ය අධ්‍යයන අංශය | ශල්‍ය පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | ඉංග්‍රීසි | - | 01 | -- | - | - | - |
| ස්ත්‍රී රෝග හා කෞමාරභෘත්‍ය අධ්‍යයන අංශය | ආයුර්වේද රූපලාවන්‍ය සහතික පත්‍ර පාඨමාලාව | සිංහල | 02 | - | - | - | - | - |
| | ස්කැනින් පාඨමාලාව (සහතික පත්‍ර) | සිංහල | 01 | - | - | - | - | - |
| මුළු ගණන | | | 03 | 02 | | | | |

13 පුනරාවර්තන වියදම් විස්තර -

| විෂයය | 2013 | 2014 |
|---|---|---|
| අ. පුද්ගල පඩිනඩි | 116,786,193 | 132,692,000 |
| ආ. ගමන් වියදම් | 513,557 | 4,881,622 |
| ඇ. සැපයුම් | 6,348,978 | 6,359,608 |
| ඈ. නඩත්තු | 2,704,778 | 3,657,230 |
| ඉ. ගිණුම්ගත සේවා/පර්යේෂණ සංවර්ධන | 31,795,242 | 36,617,126 |
| ඊ. වෙනත් / පාඨමාලා වියදම් | 12,095,356 | 11,514,937 |
| මුළු ගණන | 170,244,104 | 195,722,425 |

14. ප්‍රාග්ධන වියදම් විස්තර -

| විෂයය | 2013 | 2014 |
|---|---|---|
| පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම | 13,586,481 | 28,415,826 |
| වත්කම් මිලදී ගැනීම | 15,799,948 | 21,226,994 |
| ඉදි කිරීම | 2,766,108 | 23,008,896 |
| වෙනත් (ක්‍රමෝපාය සංවර්ධන) | - | 590,198 |
| මුළු ගණන | 32,152,537 | 73,241 ,914 |

15. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය ) –

| නම සහ විස්තර | ණය /ආධාර | ආධාර දෙන ආයතනය | මුළු පිරිවැය | අරමුදල් ලැබීම | වෙනස |
|---|---|---|---|---|---|
| වෛද්‍ය ඩබ්.ජේ.එල් චන්ද්‍රසිරි මහතා 2006 | 687,150.00 | | 687,150.00 | 687,150.00 | - |
| 2008 | 687,150.00 | N.C.A.S | 687,150.00 | 687,150.00 | - |
| 2009 | 687,150.00 | | 687,150.00 | 687,150.00 | 158,798.72 |
| | | 2,061,450.00 | | | |
| වෛද්‍ය එස්.එම්.එස්.සමරකෝන් මහතා | 287,470.79 | N.C.A.S | 287,470.79 | 287,470.79 | - |
| වෛද්‍ය තිස්ස හේවාවිතාන මහතා 2008 | 250,000.00 | U.G.C | 250,000.00 | 250,000.00 | - |
| 2010 | 250,000.00 | | 250,000.00 | 250,000.00 | - |
| 2011 | 124,800.00 | | 124,800.00 | 124,800.00 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| වෛද්‍ය එච්.එස්.සකුන්තලා මිය 2009 | 250,000.00 | U.G.C | 225,295.04 | 250,000.00 | 24,704.96 |
| වෛද්‍ය රූපා මදනායක මෙනෙවිය 2009 | 250,000.00 | | 221,918.91 | 250,000.00 | 28,081.09 |
| වෛද්‍ය ඒ.ඒ.ජේ.පුෂ්පකුමාර මහතා 2010 | 500,000.00 | | 390,799.98 | 500,000.00 | 109,200.02 |
| වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ.ජයසිංහ මහත්මිය 2010 | 500,000.00 | | 139,577.58 | 250,000.00 | 19,822.42 |
| වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී.ජයකොඩි මෙනෙවිය 2010 | 500,000.00 | | 500,000.00 | 500,000.00 | - |
| වෛද්‍ය එච්.පී.වක්කුඹුර මහත්මිය 2010<br>2013 | 250,000.00<br>500,000.00 | | 250,000.00<br>86,913.02 | 250,000.00<br>250,000.00 | 163,086.99 |
| ඩබ්.පී.බී.එච්.එස්. කරුණාරත්න මහත්මිය 2013<br>2014 | 500,000.00<br>113,280.00 | | 500,000.00<br>110,625.00 | 500,000.00<br>113,280.00 | 2,655.00 |

16. ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර- (දේශීය/විදේශීය මූල්‍ය දායකත්වය )

| නම | මුළු පිරිවැය | වියදම් 2013 | වියදම් 2014 | සමුච්චිත වියදම් 2014.12.31 දිනට | ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| වෛද්‍ය ඩබ්.ඒ.එල් චන්ද්‍රසිරි මහතා | 2,061,450.00 | 1,902,651.28 | - | 1,902,651.28 | 92 |
| වෛද්‍ය එස්.එම්.එස්.සමරකෝන් මහතා | 287,470.79 | 287,470.79 | - | 287,470.79 | 100 |
| වෛද්‍ය තිස්ස හේවාවිතාන මහතා | 624,800.00 | 624,800.00 | - | 624,800.00 | 100 |
| වෛද්‍ය එච්.එස්.සකුන්තලා මිය | 250,000.00 | 225,295.04 | - | 225,295.04 | 90 |
| වෛද්‍ය රූපා මදනායක මෙනෙවිය | 250,000.00 | 221,918.91 | - | 221,918.91 | 89 |
| වෛද්‍ය ඒ.ඒ.ජේ.පුෂ්පකුමාර මහතා | 500,000.00 | 309,176.62 | 81,623.36 | 380,799.98 | 78 |
| වෛද්‍ය ජේ.එම්.පී.ආර්.කේ.ජයසිංහ | 250,000.00 | 230,177.58 | - | 230,177.58 | 92 |
| වෛද්‍ය ජේ.ඒ.ඩී.පී.පී.ජයකොඩි මෙනෙවිය | 500,000.00 | 500,000.00 | - | 500,000.00 | 100 |
| වෛද්‍ය එච්.පී.වක්කුඹුර මහත්මිය | 500,000.00 | 250,193.15 | 86,720.00 | 336,913.15 | 67 |
| ඩබ්.පී.බී.එච්.එස්. කරුණාරත්න මහත්මිය | 613,280.00 | 500,000.00 | 110,625.00 | 110,625.00 | 100 |

17. මූලාා තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) –

| විෂයය | 2014 ප්‍රතිපාදන | 2014 වියදම | ඉතිරි /ඉක්මයාම |
|---|---|---|---|
| අ. පුනරාවර්තන නොවන ව්‍යාපෘති | 169,521,646 | 184,207,586 | - |
| ආ. ප්‍රාග්ධන නොවන ව්‍යාපෘති | 114,400,000 | 73,241,914 | - |
| ඇ. ව්‍යාපෘති දේශීය ආධාර | - | - | - |
| ඈ. ව්‍යාපෘති විදේශ ආධාර | - | - | - |
| මුළු ගණන | 283,921,646 | 257,449,500 | - |

18. මූලාා තත්ත්වයේ ප්‍රගතිය පිළිබඳවිස්තර (අභ්‍යන්තර ආදායම)

| ආදායම් ප්‍රභවය | ප්‍රතිපාදන /වෙන්කිරීම් ඇස්තමේන්තු | ලැබීම් 2014 | අඩු /වැඩි |
|---|---|---|---|
| අ. උපාධි අපේක්ෂක | 29,330,000 | 7,104,705 | - |
| ආ. පශ්චාද් උපාධි | - | - | - |
| ඇ. උපදේශක | - | - | - |
| ඈ. වෙනත් / පාඨමාලා මුදල් | | 16,206,339 | - |
| මුළු ගණන | | 23,311,044 | - |

19. මූලාා ක්‍රියාකාරිත්ව විශ්ලේෂණය - 2014

| විෂයය | සංකේතය | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පිරිවැය පුනරාවර්තන වියදම් (පු.වි)<br>පු.වි. ශිෂ්‍ය සංඛ්‍යාව | | 448,193 |
| ආ. ඒක ශිෂ්‍ය පිරිවැය ප්‍රාග්ධන වියදම් (පු.වි)<br>පු.වි. ශිෂ්‍ය සංඛ්‍යාව | | 178,204 |
| මුළු ගණන | | 626,397 |

20. යටිතල පහසුකම් සඳහා 2014 තුළ ලැබීම.-

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම | ප්‍රගතිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| මුළු ගණන | | |

21. වෙනත් විස්තර (වාර්තාවට අදාළ) :

21.1 පුස්තකාලය

2014 වර්ෂයේ පොත් ප්‍රතිග්‍රහණය කර ගැනීම.

| විස්තරය | මිල දී ගැනීම | පරිත්‍යාග | එකතුව |
|---|---|---|---|
| පොත් | 469 | - | 469 |
| වාරික ප්‍රකාශන | 06 | - | 06 |

පුස්තකාලය කමිටුවේ රැස්වීම් වාර 02 ක් පවත්වා ඇත.

21.2 පරිගණක අංශය

විද්‍යායතනය සතු කුඩා පරිගණක ඒකකයේ සිසුන් වෙනුවෙන් වූ පහසුකම් අඩු මට්ටමක පැවති බැවින් සියළු පහසුකම් වලින් සමන්විත පරිගණක 100 කින් යුතු නව පරිගණක මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම හා අන්තර්ජාල පහසුකම් ආයතනයේ සෑම ස්ථානයකටම ලබාදීමේ අරමුණින් අන්තර්ජාල ජාල ගත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

ආයතනය සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීම සහ එය අවශ්‍ය පරිදි නඩත්තු කිරීම , එය කැලණිය විශ්ව විද්‍යාලයේ වෙබ් අඩවිය යටතේ අන්තර් ජාලයට එකතු කර ඇත.

21.3 යටිතල පහසුකම් සංවර්ධනය.

අධ්‍යයන ගොඩනැගිල්ල ,පරිපාලන ගොඩනැගිල්ල, හා ශිෂ්‍ය මධ්‍යස්ථානයේ දෙවන අදියර ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම.

පැරණි පිරිමි ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ල නවීකරණය කිරීමේ කටයුතු අවසන් කිරීම. දේශනශාලාවේ කුඩාශ්‍රවණාගාරය ඉදි කිරීමේ කටයුතු අවසන් කිරීම. හා විදුලිජනක යන්ත්‍රය ස්ථාපිත කිරීම.

## අධ්‍යක්ෂ වාර්තාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ දැක්වෙන විධිවිධාන යටතේ කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2014 වර්ෂයට අදාල මූල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව.

2014 වර්ෂය සඳහා ආයතනයට මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කර ඇති ආධාර මුදල් පහත පරිදි වේ.

**පුනරාවර්තන ආධාර**

| | | |
|---|---|---|
| | | (රු. මිලියන) |
| රජයේ ඇස්තමේන්තු මගින් ලද ආධාර | - | 169.52 |
| අනෙකුත් පුනරාවර්තන ආදායම | - | 23.31 |
| | - | 192.83 |

**එකතු කළා**

| | | | |
|---|---|---|---|
| ක්‍රමක්ෂය | ප්‍රාග්ධන | - | 28.74 |
| මුළු එකතුව (පුනරාවර්තන) | | - | 221.57 |
| **මූලධන ආධාර** | | - | 114.40 |

| | | | | | |
|---|---|---|---|---|---|
| වැය ශිර්ෂ | 101 | - | පුරුත්ථාපන සහ නඩත්තු කටයුතු | - | 28.41 |
| වැය ශීර්ෂය | 102 | - | භාණ්ඩ, උපකරණ, පුස්තකාල<br>- පොත් හා වාර සඟරා අත්පත් කර ගැනීම | - | 21.23 |
| වැය ශීර්ෂය | 103 | - | ගොඩනැගිලි ඉදි කිරීම් | - | 23.00 |
| | | | වෙනත් | - | 0.60 |
| මුළු එකතුව (ප්‍රාග්ධන) | | | | | 73.24 |

**ආදායම**

2014 ගිණුම් වර්ෂය තුළ පුනරාවර්තන ආධාර ලෙස රජයෙන් ලැබුණු මුදල රු. 169,521,646 කි.

විද්‍යායතනය මගින් වර්ෂය තුළ දී අනිකුත් පුනරාවර්තන ආදායම් මාර්ග වලින් ලබා ගත් මුදල රු. 23,311,044 කි. ඒ අනුව මුළු ආදායම රු.221,574,553 කි.

**වියදම**

2014 වර්ෂය සඳහා මුළු පුනරාවර්තන වියදම රු.224,464,285 ක් විය. මේ අනුව වර්ෂයේ ආදායමට වඩා වැඩියෙන් දරා ඇති වියදම රු.2,889,732 කි.

## ස්ථාවර වත්කම් ක්ෂය කිරීම

ආයතනයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම වෙනුවෙන් 2014 වර්ෂය තුළ රු. 28,741,862 වෙන් කර ඇත.

## ප්‍රාග්ධන සේවා මූලධන ප්‍රතිඵලය

### වැය ශීර්ෂ 101 - පුනරුත්ථාපන සහ නඩත්තු කටයුතු

පුනරුත්ථාපන සහ නඩත්තු වැය ශීර්ෂ (101) සඳහා ලැබුණු ප්‍රතිපාදිත මුදල රු. 10,000,000/- ක් වන අතර, එමගින් 2014 වර්ෂය දරා ඇති මුළු වියදම රු. 18,415,830/- කි.

### වැය ශීර්ෂ අංක 102 - භාණ්ඩ අත්පත් කර ගැනීම

වත්කම් අත්පත් කර ගැනීමේ වැය ශීර්ෂ (102) සඳහා ලැබුණු ප්‍රතිපදාන මුදල රු.25,400,000/- ක් වන අතර, ඒ සඳහා දරණ ලද මුළු වියදම රු. 21,226,994/58 කි.

### වැය ශීර්ෂ අංක 103 - ඉදි කිරීම් කටයුතු

ඉදි කිරීම් වැය ශීර්ෂ (103) සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රු. 78,000,000/- ක් වන අතර, ඒ සඳහා දරණ ලද මුළු වියදම රු. 23,008,896/- කි.

### වෙනත් - ප්‍රාග්ධන වියදම්

වෙනත් ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු ප්‍රතිපාදන මුදල රු.1,000,000/- වන අතර, එම මුදලින් දරණ ලද මුළු වියදම රු.590,198/- කි.

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

## 2014.12.31 දිනට මූල්‍ය තත්වය දැක්වෙන ප්‍රකාශනය

| | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | Rs. | Rs. | Rs. | Rs. |
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| (අ) ඉඩම් | 72,126,250 | | 72,126,250 | |
| (ආ) ගොඩනැගිලි | 185,649,709 | | 167,494,630 | |
| (ඇ) කාර්යාල උපකරණ | 8,803,198 | | 8,432,755 | |
| (ඈ) රසායනාගාර හා අධ්‍ය උපකරණ | 14,320,240 | | 21,243,726 | |
| (ඉ) ලී බඩු හා සවි කිරීම් | 19,120,133 | | 18,565,336 | |
| (ඊ) පුස්තකාල පොත් සහ සඟරා | 3,160,971 | | 5,324,552 | |
| (උ) මෝටර් රථ වාහන | 3,444,730 | | 4,490,319 | |
| (ඌ) යන්ත්‍රෝපකරණ | 14,885,078 | 321,510,309 | 2,931,793 | 300,609,361 |
| (එ) වෙනත් | | 1,447,057 | | 1,109,358 |
| (ඒ) නිම නොවූ වැඩ | | 92,214,565 | | 69,205,669 |
| (ඔ) මූලධන අත්තිකාරම් | | 41,005,203 | | 5,900,954 |
| ආයෝජන | | - | | - |
| ස්ථාවර තැන්පත් | | 74,922,602 | | 60,030,163 |
| | | **531,099,736** | | **436,855,505** |
| ජංගම වත්කම් | | | | |
| (අ) ගබඩා අත්තිකාරම් | 2,399,211 | | 2,171,487 | |
| (ආ) ණය ගැතියෝ | 1,532,970 | | 1,517,040 | |
| (ඇ) ණය සහ අත්තිකාරම් | 20,513,596 | | 19,019,779 | |
| (ඈ) මිශ්‍ර අත්තිකාරම් | - | | 15,000 | |
| (ඉ) පර්යේෂණ අත්තිකාරම් | 30,000 | | - | |
| (ඊ) පෙර ගෙවීම | 156,629 | | 232,997 | |
| (උ) බැංකු ශේෂය | 16,919,095 | | 31,583,503 | |
| (ඌ) බැංකු ශේෂය ( බාහිර පාඨමාලා) | 6,135,843 | | 4,346,319 | |
| (එ) සුළු මුදල් ශේෂය | 180 | | 180 | |
| (ඒ) වෙනත් වත්කම් | 3,271,744 | 50,959,268 | 3,771,762 | 62,658,067 |
| මුළු වත්කම් | | 582,059,004 | | **499,513,572** |
| වගකීම් | | | | |
| (අ) ජංගම වගකීම් | 311,207 | | 446,200 | |
| (ආ) ගෙවීම් | 23,219,830 | | 19,837,525 | |
| (ඇ) උපචිත වියදම් | 2,994,328 | 26,525,365 | 3,111,222 | 23,394,947 |
| ජංගම නොවන වගකීම් | | | | |
| (අ) පාරිතෝෂික දීමනා වෙන් කිරීම් | | 44,318,960 | | 41,663,178 |
| මුළු වගකීම් | | 70,844,325 | | 65,058,125 |
| මුළු ශුද්ධ වත්කම්/හිමිකම් | | 511,214,679 | | 434,455,447 |
| ශුද්ධ වත්කම්/හිමිකම් | | | | |
| (අ) වැය කළ ප්‍රාග්ධනය | 293,097,929 | | 248,597,876 | |
| (ආ) වැය නොකළ ප්‍රාග්ධනය | 77,641,704 | | 36,483,619 | |
| (ඇ) අරමුදල | (30,331,096) | | (27,175,555) | |
| (ඈ) විශේෂ කටයුතු සඳහා වූ ප්‍රදාන | 29,745,309 | | 176,549,506 | |
| (ඉ) වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | 14,106,033 | | | |
| මුළු ශුද්ධ වත්කම්/හිමිකම් | | 511,214,679 | | 434,455,447 |

මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ
අධ්‍යක්ෂ

ඩබ්.ඒ.පී.එස්. මොලගොඩ
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනය

| | 2014 රු. | රු. | 2013 රු. | රු. |
|---|---|---|---|---|
| මෙහෙයුම් ආදායම් | | | | |
| පුනරාවර්තන ආධාර | | 169,521,646 | | 137,100,000 |
| ක්‍රමක්ෂය | | 28,741,863 | | 25,832,426 |
| වෙනත් ආදායම් | | | | |
| (1) ණය සහ අත්තිකාරම් පොලී | 825,525 | | 807,189 | |
| (2) විවිධ ලැබීම් | 996,235 | | 404,651 | |
| (3) පොලී ආදායම | 4,309,183 | | 6,986,849 | |
| (4) ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු | 433,670 | | 287,115 | |
| (5) විභාග ගාස්තු | 28,350 | | 23,350 | |
| (6) පුස්තකාල දඩ මුදල් | 61,992 | | 38,352 | |
| (7) වෛද්‍ය ගාස්තු | 46,550 | | 12,870 | |
| (8) දේපල වලින් වූ කුලී ආදායම් | 388,015 | | 351,974 | |
| (9) ප්‍රකාශන විකුණුම් | - | | - | |
| (10) රථ වාහන විකුණුම් | - | | 432,073 | |
| (11) පැරණි භාණ්ඩ විකුණුම් | 15,185 | | 62,547 | |
| (12) බාහිර පාඨමාලා ආදායම් | 16,206,339 | | 15,266,960 | |
| | | 23,311,044 | | 24,673,930 |
| | | **221,574,553** | | **187,606,356** |
| මෙහෙයුම් වියදම් | | | | |
| (1) පුද්ගල පඩිනඩි | 132,692,000 | | 116,786,193 | |
| (2) ගමන් වියදම් | 4,881,622 | | 513,557 | |
| (3) සැපයීම | 6,359,608 | | 6,348,978 | |
| (4) නඩත්තු | 3,657,230 | | 2,704,778 | |
| (5) ගිවිසුම් ගත සේවා | 28,356,870 | | 23,559,257 | |
| (6) පර්යේෂණ සහ සංවර්ධන | 107,250 | | 147,735 | |
| (7) ක්ෂය වීම් | 28,741,862 | | 25,832,426 | |
| (8) වෙනත් මෙහෙයුම් වියදම් | 8,153,006 | | 8,088,250 | |
| (9) පාඨමාලා වියදම් | 11,514,837 | | 12,095,356 | |
| (10) මුළු මෙහෙයුම් වියදම් | | **224,464,285** | | **196,076,530** |
| මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ අතිරික්තය (ඌනතාවය) | | **(2,889,732)** | | **(8,470,174)** |

19

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊයි/එෆ්/ජීඩබ්ජ්අයි/ 1/14/67

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 ජූලි 9 දින

නිසි බලධාරි,

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය.

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2015 මැයි 15 දින නිකුත්කරන ලදි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාර උපචිත පදනමට පාඨමාලා ආදායම කාලපරිච්ඡේදය අනුව ගිණුම්ගත කළ යුතුව තිබුණත් 2014 [illegible] පාඨමාලා 12 ක් සඳහා [illegible] වූ රු.11,514,837 කට අදාල ආදායම් හඳුනාගෙන නොතිබුණි.

(ආ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 න් බැහැරව ත්‍යාග හා ආධාර යටතේ ලද වත්කම් රු.14,986,418 ක් වෙනුවෙන් වූ ක්‍රමක්ෂය ත්‍යාග හා ආධාර අරමුදලටද ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම රු.148,719,740 ක් වූ වත්කම් සම්බන්ධයෙන් වූ ක්‍රමක්ෂය ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට ද හර නොකර වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට හර කර තිබුණි. තවද ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ක්‍රමක්ෂය අනුචිත පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවී තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනය විසින් මිලදී ගන්නා ලද හා විද්‍යායතනයට පවරා ගන්නා ලද පර්චස් 243.9 ක ඉඩම් තක්සේරු කර එහි වටිනාකම වත්කමක් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වත්කමක් භාවිතය සඳහා සුදුසු තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් එම වත්කම් ක්ෂය කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළ මිලට ගෙන තිබූ එකතුව රු.3,859,676 ක් වටිනා පුස්තකාල පොත්, ක්‍රීඩා හා කාර්යාල උපකරණ සහ ලීබඩු සවිකිරීම් වෙනුවෙන් ක්ෂය කිරීමට කටයුතු නොකිරීම නිසා රු.97,296 ක්වූ ක්ෂය වටිනාකම ගිණුම්වල ගලපා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂ වලදී නිම වූ පාඨමාලා සඳහා ලැබී තිබුණු රු.758,363 ක ලැබීම් පොදු සංචිතයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමට බැරකර තිබීම හේතුවෙන් වර්ෂයේ මෙහෙයුම් ආදායම් වැඩි වී තිබුණි.

(ඈ) 2014 වර්ෂයේ පුස්තකාලයට KOHA නමින් රු.240,000 ක් වටිනා මෘදුකාංග පද්ධතියක් (Software Package ) මිලට ගෙන තිබූ අතර, මෙම අස්පෘශ්‍ය වත්කම් පුස්තකාල පොත් යටතේ එකතු කිරීම් ලෙස දක්වා තිබුණි.

(ඉ) ආයෝජන පොළිය රු.4,309,183 ක් සම්බන්ධයෙන් ගෙවන ලද රඳවාගැනීම් බදු ගිණුම් ගත කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විද්‍යායතනය සතු නේවාසිකාගාර 03 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ නේවාසිකාගාර ගාස්තු රු.201,695 ක්වූ අතර 2012/2013 අධ්‍යයන වර්ෂයට අදාළව නේවාසිකාගාර ගාස්තු අයකර ගැනීමේ ප්‍රමාදයක් ඇති බව නිරීක්ෂණය විය.

### 2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාල පොත්පත් ලේඛන විධිමත්ව පවත්වා නොතිබීම හේතුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවූ එකතුව රු.60,569,849 ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 | ඔසු උයන පිහිටි ඉඩමේ පවතින ගොඩනැගිල්ල හා ඊට අදාල භාණ්ඩ පිළිබඳ සිදුකළ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| | (i) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක 45 දරන චක්‍රලේඛය | මුල්‍ය ප්‍රකාශන සමඟ කළමනාකරණ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණු අතර මුල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අත්සන් නොකර අධ්‍යක්ෂ හා මුල්‍යාධිකාරී විසින් අත්සන් කර තිබුණි. |
| | (ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන චක්‍රලේඛය | මුල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන චක්‍රලේඛය | (i) ගාස්තු අය කිරීමේ පාඨමාලා සම්බන්ධයෙන් චක්‍රලේඛයට පටහැනිව විද්‍යායතනය විසින් සකස් කරනු ලැබූ නිර්නායක පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තුව තුළ පාඨමාලා 08 ක් සඳහා සති අන්ත දීමනා ලෙස රු.572,000 ක් සහ මාසික දීමනා ලෙස රු.96,500 ක් අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.<br>(ii) 2014 මාර්තු 25 සිට 2014 මාර්තු 28 දින දක්වා පැවති ආයුර්වේද වෛද්‍ය ශිෂ්‍යයින් සඳහා වූ "අභිමන් අභියස - III" වැඩසටහන සඳහා චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව මුදල් කමිටු අනුමැතිය මත පැයකට රු.3,000 සහ රු.2,000 බැගින් සම්පත්දායක දීමනා වශයෙන් බාහිර සම්පත්දායකයින් 06 දෙනෙකු වෙත එකතුව රු.136,000 ක් ගෙවා තිබුණි.<br>(iii) කොන්ත්‍රාත් වටිනාකම මිලියන 46 ක් වන ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ දෙවන අදියර ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වැඩ ඉංජිනේරු මහතාගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් සෘජු ඉදිකිරීම් වටිනාකමින් සියයට 0.25 ක් වන රු.89,750 ක් විධිමත් අනුමැතියකින් තොරව ගෞරව දීමනාවක් ලෙස ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛය අනුව සති අන්ත හා රජයේ නිවාඩු දිනවල සේවයේ යෙදීම වෙනුවෙන් 1/20 දීමනා හිමි නොවන පරිගණක උපදේශකවරුන් සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළදී එම දීමනා වශයෙන් එකතුව රු.54,107 ක් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,889,732 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,470,174 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.5,580,442 කින් අඩුවීමට රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.32,421,646 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**4.1.1 අධ්‍යයන කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009/2010 අධ්‍යයන වර්ෂයේදී ආයුර්වේද සහ ශල්‍ය වෛද්‍ය උපාධි පාඨමාලා අවසන් විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව 107 ක් වූ අතර එයින් 95 දෙනෙකු හෙවත් සියයට 89 ක් සමත්ව තිබුණි.

(ආ) 2012/2013 අධ්‍යයන වර්ෂයේදී මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 88 ක් වුවද එයින් 07 දෙනෙකු පාඨමාලාව අතහැර ගොස් තිබුණි.

4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විද්‍යායතනය විසින් කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත සකස් කළ නිර්නායකයට අනුව රජයේ නිවාඩු දින හෝ සති අන්ත නිවාඩු දිනයන්හි පාඨමාලා සංවිධානය කිරීම සඳහා දිනකට රු.5,000 ක උපරිමයකට යටත්ව ගෙවිය හැකි වුවත් දිනකදී සංවිධානය කරනු ලබන පාඨමාලා සංඛ්‍යාව පදනම් කරගෙන රු.5,000 බැගින් ගෙවීම් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මුල් කාර්තුව තුළදී රු.245,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2014 වර්ෂයට පෙර පුස්තකාලයෙන් ශිෂ්‍යයන් වෙත ලබා දී තිබූ එකතුව රු.99,084 ක් වූ පොත් 106 ක් සහ 2014 වර්ෂයේ දී ලබා දුන් පොත් 25 ක් 2015 අප්‍රේල් මාසය වන විටත් ආපසු භාර දී නොතිබුණි.

4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකර වසර 03 කට වැඩි කාලයක් ගත වුවද අවසන් බිල්පත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් ලබා ගැනීමට නොහැකි වීම නිසා වියදම් ප්‍රග්ධනිත කර නොතිබුණි. මෙම ඉදිකිරීම වෙනුවෙන් ගෙවා තිබූ රු.3,701,862 ක් වූ ප්‍රාග්ධන අත්තිකාරමද රඳවා ගත් රු.8,262,316 ක රැඳවුම් ගාස්තු ද නිරවුල් කිරීමට විගණිත දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසානයේදී විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 22 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 16 ක් විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු සඳහා බාහිර කථිකාචාර්යවරුන් 21 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

විද්‍යායතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රධාන අරමුණු 04 ක් පැවැති අතර 2014 දෙසැම්බර් 31 දින වන විට උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා වූ ලෝක තත්ත්වයේ විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම පළමු අරමුණ වශයෙන් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ මේ සඳහා රු.3,765,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද වාර්ෂික ප්‍රගතිය සලකා බැලීමේදී මේ යටතේ වූ උප කාර්යයන්හි මූලික කටයුතු පමණක් ඉටුකර තිබූ අතර මුළු ප්‍රතිපාදිත මුදලම ඉතිරි වී තිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

2015 පෙබරවාරි 27 දින කළමනාකරණ මණ්ඩල පත්‍රිකා අංක 224 මඟින් 2014 වර්ෂයේ සංශෝධිත අයවැය අනුමැතියට ඉදිරිපත් කර තිබූ අතර එම සංශෝධිත අයවැය අනුවද සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති අතර අයවැය ලේඛනය මූල්‍ය කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින් වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) පුස්තකාල පාලනය

(ඈ) වාහන පාලනය

(ඉ) කොන්ත්‍රාත් පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

ඒසී7/ජීඩබ්ලිව්ඒඅයි විගණන විමසුම් - 2014 ඒසී/එෆ්/ජීඩබ්ඒඅයි/1/14/67 2015.11.09

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන),
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

උක්ත කරුණ සම්බන්ධයෙන් එවනු ලැබූ ඔබගේ අංක EC/F/GWAI/1/14/67 දරණ 2015/07/09 දිනැති විගණන වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් මෙසේ අදහස් දක්වමි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

1.3 විගණකගේ වගකීම

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

(අ) උපචිත පදනම ආදාළ කර නොගැනීමේ අඩුපාඩුව නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.

(ආ) ත්‍යාග හා ආධාර යටතේ ලද වත්කම් වලට අදාළ මුදල වන රු. මිලියන 14 2015 වර්ෂයේ දී නිවැරදි කර ඇති අතර ප්‍රත්‍යාගණනය කරන ලද රු. මිලියන 149 සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දී ඇති ආකාරයට කටයුතු කරන බව දන්වමි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අ මෙහි සඳහන් ඉඩම් වටිනාකම තක්සේරු කර ගැනීම සඳහා පළාත් තකසේරුකරු වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වමි.

ආ සමාලෝචිත වර්ෂයතුළ මිලට ගෙන තිබූ පුස්තකාල පොත් සහ ක්‍රීඩා හා කාර්යාල උපකරණ සම්බන්ධයෙන් ක්ෂය කිරීම් 2015 වර්ෂයේදී නිවරුදි කර ඇති අතර එම වර්ෂයේ දෙසැම්බර් මාසයේ මිලදී ගත් වත්කම් පමණක් ඉදිරියේදී ක්ෂය කිරීමට නියමිතව ඇති බව දන්වමි.

ඇ. ආයතනය විසින් ගාස්තු අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා කිහිපයක කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඉදිරියට ගෙන ආ ශේෂයන් 2014 වර්ෂයේ පොදු සංචිතයට මාරු කිරීම වෙනුවට අතපසුවීමකින් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැලපීම් සිදුකර ඇත. එවැනි අතපසුවීම් ඉදිරියේදී ඇති නොවීමට කටයුතු කරන බව දන්වමි.

ඈ. 2014 වර්ෂයේ පුස්තකාලය වෙනුවෙන් මිලදී ගෙන තිබූ මෘදුකාංග පද්ධතිය අස්පෘෂ්‍ය වත්කම් ලෙස 2015 වර්ෂයේදී නිවැරදි කර ඇති බව දන්වමි.

ඉ ආයෝජන පොලී සම්බන්ධයෙන් ගෙවන ලද රඳවා ගැනීමේ බදු වෙන් ව හඳුනාගත හැකිවන පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු යොදා ඇති බව දන්වමි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විද්‍යායතනය සතු නේවාසිකාගාර සම්බන්ධයෙන් අයවිය යුතු හිඟ නේවාසිකාර ගාස්තු ප්‍රමාණය රු. 123,265/- ක් වන අතර එම මුදල් සහතිකපත් නිකුත් කිරීමේදී අයකර ගැනීමට කටයුතු සිදු කර ඇත.

2.4 නීති රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | | |
|---|---|---|
| අ. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3 (I) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෛනික පැමිණීම සහතික වීම සඳහා එක් එක් අධ්‍යයනාංශ මගින් ලේඛනයක් පවත්වාගෙන යන බව දන්වමි. |
| ආ | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 756 | ඔසු උයන පිහිටි ඉඩමේ පවතින කුඩා ගොඩනැගිල්ල තුල බඩු බාහිරාදිය නොමැති බැවින් එහි සමීක්ෂණයක් සිදු වී නොමැති අතර ඉදිරියේදී එම ගොඩනැගිල්ල සමීක්ෂණය කර වාර්තාවක් විගණනයට ඉදිරිපත් කරන බව දන්වමි. |

ඇ. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක 45 දරන චක්‍ර ලේඛය | මූල්‍ය ප්‍රකාශන ආයතනයේ කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව කළමනාකරණ මණ්ඩලයේ සභාපති වන ආයතනයේ අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය මූල්‍යාධිකාරීගේ අත්සනින් යුතුව විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී කළමනාකරණ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශය සහිතව තවත් කළමනාකරණ මණ්ඩල සාමාජික භවතෙකුගේ අත්සන ද සහිතව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| ii 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍ර ලේඛය | වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. |
| iii 1994 ජූනි 14 දිනැති අංක 95 දරන චක්‍ර ලේඛය | (i) ගාස්තු අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ උපදෙස් ලැබෙන තුරු ආයතනයේ මුදල් කමිටුව සහ කළමනාකරණ මණ්ඩල අනුමැතිය සහිත නිර්නායක පදනම් කරගෙන බාහිර පාඨමාලා වලින් උපයන මුදලින් එම පාඨමාලා අපහසුතාවයකින් තොරව පවත්වාගෙන යාමේ අරමුණින් අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවීම් සිදු කර ඇති බව දන්වමි.<br><br>ii ආයුර්වේද වෛද්‍ය සිසුන්ගේ විශේෂ අධ්‍යයන කටයුත්තක් වෙනුවෙන් පවත්වනු ලැබූ මෙම අභිමත් අභියස වැඩ සටහන සාර්ථකව පවත්වාගෙන යාමේ අරමුණින් වෘත්තීමය සම්පත් දායකයින්ගේ සේවය ලබා ගැනීමට සිදු විය. එසේ ලබා ගත්තා ලද සේවය වෙනුවෙන් පැයකට රු. 2000/- සහ රු. 3000/- වශයෙන් සම්පත් දායක දීමනා ගෙවීම් ආයතනයේ මුදල් කමිටුව සහ කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇත. |

iii ශිෂ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ 11 වන අදියර ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උසස් අධ්‍යාපන අමාත්‍යංශයට යොමු කරන ලද ව්‍යාපෘති යෝජනාවට අදාලව 2013 මැයි මස 7 දිනැති කැබිනට් මණ්ඩල පත්‍රිකා අංක HE/ID/2013/32 අනුව (Turnkey Basis) යටතේ අවශ්‍ය අනුමැතිය ලබා දී ඇත.

ඉදිකර නිමකර දීමේ (Turnkey) පදනම යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳව අත්දැකීම් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුළ නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ලංසු ලේඛන සහ සැලසුම් සකස් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වැඩ ඉංජිනේරු මහතාගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත.

ඒ අනුව මෙම කාර්යයට අදාල ලංසු ලේඛන සහ සැලසුම් සකස් කිරීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වැඩ ඉංජිනේරු මහතා විසින් ඉටු කල අතර එම සේවයට අදාලව මුදල් කමිටු අනුමැතිය පරිදි 0.25% ක දීමනාවක් ගෙවීමට කටයුතු කර ඇත.

එසේ නොවුණේ නම් ව්‍යාපෘතිය සඳහා උපදේශන ආයතනයක් පත් කළ යුතු අතර ඒ සඳහා විශාල වියදමක් දැරිය යුතු වේ. එසේම ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීම සඳහා මෙම ක්‍රම වේදය යහපත් වූ බව දන්වමි.

ඇ. 1997 පෙබරවාරි 03 දිනැති අංක 07/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

සති අන්ත හා රජයේ නිවාඩු දින සේවය කිරීම වෙනුවෙන් පරිගණක උපදේශකවරුන් සඳහා අතිකාල හා නිවාඩු දින ගෙවීම් සිදු කිරීම පවතින චක්‍රලේඛවලට අනුකූල නොවන බැවින් ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර අදාළ ක්‍රමවේදයක් සකස් කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අධ්‍යයන කාර්ය සාධනය

(අ), (ආ) බී.ඒ.එම්.එස්. උපාධි පාඨමාලාව සඳහා 2012/2013 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන් 88 කි. ඉන් පාඨමාලාව අතහැර ගිය සංඛ්‍යාව 16 කි. එම 16 න් 09 දෙනෙකුම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දුන් මාරුවීම් අනුව වෙනත් විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වූ සිසුන් ය.

4.2 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

ආයතනයේ ශාස්ත්‍ර අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා සංවිධානය කිරීමේ කටයුතු සඳහා රජයේ නිවාඩු දින හෝ සති අන්ත නිවාඩු දිනවල පැමිණීම වෙනුවෙන් පාඨමාලා 5 ක උපරිමයකට යටත්ව එක් පාඨමාලාවකින් දිනකට රු. 5000/-ක් බැගින් පාඨමාලා ඉපයීම් වලින් අනුමත ඇස්තමේන්තුවලට අදාළව ගෙවීම් සිදු කර ඇති බව දන්වමි. ශාස්ත්‍ර අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්හි රාජකාරී කටයුතු කිරීම වෙනුවෙන් සේවක භවතුන් හට ගෙවීම් කරන ආකාරය පිළිබඳව, පැහැදිලි චක්‍රලේඛ උපදෙස් ලැබෙන තුරු ඒ වෙනුවෙන් ආයතනයේ මුදල් කමිටුව සහ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත නිර්ණායක වලට අනුව මෙම පාඨමාලාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණින් ගෙවීම් සිදු කර ඇති බව දන්වමි. මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාරය වෙත දැනුවත් කර ඇති බව ද දන්වමි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පුස්තකාලයෙන් බැහැරව ගෙන ගොස් තිබූ පොත් 7330 ක ප්‍රමාණයෙන් මේ වන විට ලබාගත යුතුව ඇත්තේ පොත් 106 ක ප්‍රමාණයකි. එම පොත් ප්‍රමාණය ද ආපසු ලබා ගැනීමේ අරමුණින් කටයුතු සිදු කරන බව දන්වමි. ආපසු ලබා ගැනීමට ඇති පොත්වල වටිනාකම රු. 30,812.45 ක් වන බව ද දන්වමි.

4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පුස්තකාල ගොඩනැගිල්ලට අදාල අවසන් බිල්පත ලබා ගැනීම සම්බන්ධයෙන් නැවත වතාවක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

දනට ආයතනයේ පුරප්පාඩුව පවතින අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩල පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වමි.

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දනට පුරප්පාඩු වී ඇත්තේ තනතුරු 11 ක් පමණි.

බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය අත්‍යාවශ්‍ය හා විශේෂිත දේශන සම්බන්ධයෙන් ලබාගෙන ඇති බවත්, අදාල පුරප්පාඩු වී ඇති තනතුරු වෙනුවෙන් වැයවන ඇස්තමේන්තු ඉක්මවා ගෙවීම්කර නොමැති බවද දන්වමි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කර නැවත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි.

5.2 අයවැය ලේඛනමය පාලනය

2014 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව 2013.08.16 දින පත්‍රිකා අංක 207 - 07 යටතේ කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අංක UGC/RE/2014 හා 2013 දෙසැම්බර් 31 දිනැති ලිපියට අනුව 2014 වර්ෂයට අනුමත ප්‍රතිපාදන මත නැවත සකස් කරන ලද අයවැය 2014.01.22 දින පත්‍රිකා අංක 212 වෙ. 03 යටතේ ඉදිරිපත් කර අදාල අනුමැතිය ලබා ඇත.

2014 වර්ෂය තුළ අවස්ථා කීපයකදී සිදු වූ වැටුප් වැඩිවීම තුලින් එම වර්ෂයේ අයවැය ගත වටිනාකම හා සත්‍ය වියදම් අතර විචලනයන් සිදු වී ඇත. අදාල විචලතා සැලකිල්ලට ගෙන ඊට අදාලව ආයතනයේ අයවැය සංශෝධනය කරන ලදී. එම සංශෝධිත අයවැය (පත්‍රිකා අංක 224 වෙ. 2 යටතේ) කළමනාකරණ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර අනුමැතිය ලබා ඇත.

කෙසේ වුව ද ඉදිරියේදී අයවැය ලේඛනය හැකි තරම් දුරට මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කරගැනීමට කටයුතු කරන බව දන්වමි.

6. <u>පද්ධති හා පාලනයන්</u>

මේ යටතේ දක්වා තිබූ පද්ධති හා පාලන අඩුපාඩු හැකි තරම් දුරට අවම කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.

නිසි බලධාරී
මහාචාර්ය ජයන්ත වැලිහිඳ